// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1981/76 – 2016 අගෝස්තු 25 වැනි බ්‍රහස්පතින්දා – 2016.08.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත 1 ඡේදයේ විස්තර කරනු ලබන පරවශතාවය, පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි. එකී පරවශතාවය අත්කර ගනු ලබන්නේ කවර ඉඩමකින්ද යන්න 2 ඡේදයේ විස්තර වේ.

1 *පරවශතාවේ විස්තරය.* – රිදියගම ජල සම්පාදන ක්‍රමය යටතේ ජල පවිත්‍රාගාරයට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටස්වල පරවශතාවය අත්කර ගැනීම.

2 *ඉඩමේ විස්තරය.* – දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම් පත්තුව සුළු කොට්ඨාසයේ රිදියගම (අ.ග.පි. 564) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එච්/ඒඑම්බී/2012/624 හා 2012.12.04 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.1670 ක් පමණ වන රිදියගම ගමේ වාරිමාර්ග ඉඩම නොහොත් රජයේ ඉඩම නැමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'බී' – **රිදියගම ගමේ වාරිමාර්ග ඉඩම නොහොත් රජයේ ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.1670 පමණ**

උතුරට: වාරිමාර්ග දෙපාර්තමේන්තුව හිමිකම් කියන ඉඩම සහ රිදියගම අම්බලන්තොට මාර්ගය; නැගෙනහිරට: රිදියගම අම්බලන්තොට මාර්ගය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව හිමිකම් කියන ඉඩම; දකුණට: වාරිමාර්ග දෙපාර්තමේන්තුව හිමිකම් කියන ඉඩම සහ අම්බලන්තොට ප්‍රාදේශීය සභාව හිමිකම් කියන ඉඩම; බටහිරට: අම්බලන්තොට ප්‍රාදේශීය සභාව හිමිකම් කියන ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව හිමිකම් කියන ඉඩම.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ යොමු අංකය: 4/3/9/2012/ඩබ්ලිව්එස්/77.
2016 මාර්තු මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09-378

1A – G24117 – 12 (2016/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*